# නිවීගිය සුවඳ තෙල් පහන



## අපවත් වී වදාල කර්මට්ඨානාචාර්ය අතිපූජනීය
## දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේගේ
## සංක්ෂිප්ත චරිතාපදානය

**ප්‍රකාශය**

නාථගණේ අරණ්‍ය සේනාසනාරක්ෂක මණ්ඩලය

මහකෙළිය - මාස්පොත

2015 - 02 - 28

# නිවීගිය සුවඳ තෙල් පහන



## අපවත් වී වදාල කර්මස්ථානාචාර්ය අතිපූජනීය
## දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේගේ
## සංක්ෂිප්ත චරිතාපදානය


**ප්‍රකාශය**

නාථගණේ අරණ්‍ය සේනාසනාරක්ෂක මණ්ඩලය
මහකෙළිය - මාස්පොත
2015 - 02 - 28

# අපවත් වී වදාළ අතිපූජ්‍ය කම්මට්ඨානාචාර්ය දාස්වත්තේ සුමනසීල ස්වාමින් වහන්සේගේ සංක්ෂිප්ත ජීවන චරිතය

'' නමෝ තස්ස භගවතෝ  අරහතො සම්මා සම්බුද්ධස්ස''///

**දුල්ලභෝ පුරිසාජඤ්ඤො-නසො සබ්බත්‍ථ ජායති**

**යත්‍ථ සො ජායති ධීරෝ-තං කුලං සුඛමේධති.**

(ධම්මපද බුද්ධ වග්ග)

පුරුෂ ශ්‍රේෂ්ඨයා දුර්ලභය, හෙතෙම භූමිය සැම තැනම නුපදියි.ඒ උතුම් නුවණැත්තා උපදින කුලය සැපයට පැමිණෙයි.

දැහැමින් සෙමින් දිවි ගෙවන සාසනමාක මහෝපාසකෝපාසිකා පෙළපතකම සැමතැනම නුපදින දුර්ලභ පුරුෂ ශ්‍රේෂ්ඨයෙක් වශයෙනි අතිපූජ්‍ය දාස්වත්තේ සුමනසීල ස්වාමින් වහන්සේ මේලොව පහළවුනේ.

## ජන්මලාභය

සිරි ලංකාවේ සිරි දළදා ස්වාමින් වහන්සේගේ ආශිර්වාදය ලැබුමට මහත් පිං ඇති සබරගමු පළාතේ කෑගලු දිසාවේ වතු දහසකින් එකමුතු වූ දාස්වත්ත ගම්පියසේ දී සත්ගුණවත් .ඇම්. ආර් උක්කුබණ්ඩා පියතුමාට පිය සෙනෙහස පපා සත්ගුණවත් ඒ.ආර්. පුංචිමහත්මයා මව්තුමියට මව් සෙනෙහස පපා නිමල් ගාමිණි බණ්ඩාර නමින් පුරාකෘත පුණ්‍ය මහිමයකට උරුමකම් ඇතිව මිනිස් ලොව මිනිස් ගුණ ඇති මිනිස් දරුවෙකු ලෙස උපත ලැබු සේක.

## පවුල් පසුබිම

මධ්‍ය දේශගුණයෙන් යුතු කඳු -හෙල් -නිම්න -මිටියාවත් වලින් හා සරුසාර කෙත්වතු වන පෙත් වලින් යුතු සොබාදාහමේ අරුම උරුමය හිමි ජන්ම භූමියේ බොහෝ සෙයින් වත්මන් දැයේ දරුවන්ට අහිමි වන ස්වක්‍රීය සුන්දර ළමා ලෝකය තුල ළමා කාලය කෙමින් ගෙවුනේ එක් සොයුරෙකුට හා සොයුරියන් තිදෙනෙකුට දෙටු සොයුරු වෙමින් මාපිය සෙවනෙහිය.

## ඇදුරු සෙවණේ සිප්සතර

ළදරු කාලය ඉක්ම ළමා වයසට පැමිණිින ආදර නිමල් පුතා සිප්සතර පිණිස නිසි වයසට පැමිණි හෙයින් උස්සාපිටිය බෝධිරාජ විදුහලට ඇතුලත් කිරීමට පමා නොවූයේ මා පිය වගකීම අඩුවක් නොමැතිව ඉටු කිරීමක් වශයෙනි. ඒ හුදෙක් අනාගත සුභ පැතුම් ද එකතු කරවමිනි. මූලික අධ්‍යාපනය උස්සාපිටිය බෝධිරාජ විදුහලෙන් ලැබූ නිමල් කුල කුමරු උසස් අධ්‍යාපනය සඳහා මාවනැල්ල මයුරපාද මහ විදුහලට ඇතුලත් විය. ගුරු සිත නොරිදවා වේලාව නොවරදවා අකුරු කරන පිනැති සිසු නිමල් ස්වකීය අධ්‍යාපනය ක්ෂෙත්‍රය තුළ වාණිජ අංශයෙන් ඉහළ මට්ටමකට හැදෑරීම් කළේය.

## මොනවා කළත් වැඩක් නෑ

වයසින්, ගුණයෙන්, නුවණින් වැඩෙන නිමල් පුතා යම් යම් දේ පිළිබඳ ගැඹුරින් සිතන බවක් මව්පියන්ට පෙනී ගියහ. වෙනදා මෙන් පාසැලේ පන්තියේ සොයුරු සිසු සිසුවියන් සමඟ ද වැඩි මිතු දමක් නොවීය. අමනාපයක් ද නොවීය. කෙමෙන් පාසැල් අධ්‍යාපනය නිමකල නිමල් සුනිමල් දිවිපෙවෙතක් පිණිස සිහින මවයි. හුදෙක් ඒ මවන සිහිනය සුන්දර කුල කුමරියක් සරණ පවා ගැනුමට නම් නොවෙමය. සිය දිවියේ සැබෑ ආධ්‍යාත්මික පරිවර්තනයක් උදෙසාමය. අස්ථිර ලොව තුල ස්ථිර කිසිවක් නොමැති හෙයින් මොනවා කළත් වැඩක් නෑ යන අවබෝධයෙනි.

## අභිනිෂ්ක්‍රමණය

සාරසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් දානාදී සමතිස් පෙරුම් පිරූ සිද්ධාර්ථ මහබෝසතාණෝ විසි වරසක් ගිහිගෙයි වසා ගිහි සැප විඳ සත් දිනකින් ලැබෙන සක්විති රජ සැපත පවා අතහැර සදාතනික විමුක්ති සුවය සොයා වනගත වූ සේක. අමිල ගුණැති සුනිමල් දිවිපෙවෙතකට මාන බලන නිමල් හඳු යොවුන් වියේ දැන් පසුවෙයි. සදාදර මාපිය දෙපළ කුසල් වැඩුමට දන් පිං කෙරුමට පිහිට කරගත් මැල්ලගල සිහියට එයි. කෑගල්ල, පල්ලේගම, දීවෙල, මැල්ලගල පෙර මහරහතුන් වැඩ විසූ සුන්දර වන අරණකි. අද එය මැල්ලගල යෝගාශ්‍රමය නමින් ව්‍යවහාර කෙරේ. දැහැමි දිවිපෙවතක් ගෙවන මා පිය ආභාෂය ලැබූ අතිජාත පුත් රුවනක් වූ නිමල් තරුණයා පොහෝ දිනවලට මෙන්ම හිතෙන සැම මොහොතකම මැල්ලගල යෝගාශ්‍රමයට යයි. මෙය ස්වකීය සිහිනය මල්ඵල ගැන්වීමට ඉවහල් විය.

දිනක රාත්‍රී ආහාරයෙන් පසු දයාබර දෙගුරුන් පා වැද "අම්මේ තාත්තේ මට ගෙදර ඉන්න බෑ. මම ආරණ්‍යයට යනවා. මට මහන වෙන්න ඕනෑ. ඒ සඳහා අවසර දෙන්න" යැයි

පැවිද්දට අවසර ඉල්ලීය. අම්මා බිම් බලා කරබා ගත්තාය. තාත්තා උඩ ගිහින් බිම වැටුණි. සොයුරු සොයුරියන් ඔවුනොවුන් මුහුණ බලා මොනවදෝ හිමිහිට මුමුණනු පෙනුනි. ස්වල්ප වේලාවකින් සැමදෙනා නින්දට වැටුණි. නිමල්ට එදා සුව නින්දක් නොවීය. පසු දින අරුණාළු උදාවිය. අරුණෝදයත් සමඟ කුරුළු ගීය ඇරඹුණි. අම්මා සුපුරුදු පරිදි ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළාය. සත්වගට සෙත් දෙවන සෙත් පිරිත් ස්වරය ගුවන් ගැබසිසාරා පැතිර යයි. නිමල් අවදියෙනහි දිවියේ කිසි දිනෙක නොවිඳි සතුටක් සිතට දැනේ. කිමදෝ මේ අරුම පුදුමය.

ආදර අම්මාගේ සුරතින් පිසු උදේ ආහාරය ගත් පසු හැම දෙනා ගෙයි මඩුවට එක් වුණි.

**" මා භික්ඛම මහාවීර - ඉතෝ තේ සත්තමේ දිනේ**
**දිබ්බන්තු චක්කරතනං - අද්ධා පාතු භාවිස්සති**

මහාවීර වූ සිද්ධාර්ථයෙනි ! අදින් සත්වැනි දවස ඔබට චක්‍රවර්ති රාජ්‍යය පහළවෙයි. දිව්‍යමය චක්‍රරත්නය ආදිකොට ඇති සත්රුවනින් හෙබි දෙව් සැපත පරයන සක්විති සැපත නිසැකයෙන්ම ඔබට ලැබෙනු ඇත. එබැවින් නොයව "යනුවෙන් වසාවත් මරු ගිහිගෙයින් නික්මයන මහ බෝසතුන් අමතා පැවසීය. එහෙත් බෝසතාණෝ ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ සේක.

ගෙයි මඩුවතුල සිටි නිමල් පුතු ඇමතූ දයාබර මාපිය දෙපළ "පුතේ අදහස බොහොම හොඳයි. අපේ අකමැත්තක් නෑ. හොඳට හිතලා බලලා තීරණයක් ගනින්" යැයි පැවසූහ. නිමල්ගේ සිත සතුටින් පිරී ගියේය. මේ අදහස දැනගත් පවුලේ වැඩිහිටියෝ ඇතැමෙක් සතුටු වූ අතර ඇතැමෙක් නොසතුටු වූහ. නොසතුටු වූ අය වෙනත් යෝජනා ගෙනාවේය. ඉහත සඳහන් බෝසතුනට ලැබුණ මාර ඇරයුම සිහිවුන නිමල් තරුණයා කවුරු එපා කීවත් මම යනවා" යන තීරණයතුල සිට ටික දිනකින් ගිහිගෙය අතහැර මැල්ලගල යෝගාශ්‍රමයට පැමිණියේ පෙර බුදු සසුන්හිදීත් පැවිද්ද බලා පිරූ නෙක්ඛම්ම පාරමිතා අනුහස් බලයෙනි.

## නිමල් බුදු පුතෙක් වෙයි

එවකට මැල්ලගල යෝගාශ්‍රමයෙහි වැඩ විසූ සාසනභාරධාරී සංඝපිතෘවර අතිපූජනීය මිනුවන්ගවුවේ නාගිත මාහිමි, අතිපූජනීය කොහෙල්පන්නල සුමන මා හිමි යන ගුරු උතුමන් වෙත හෙරණ බණ දම් වන පොත් කිරීම, වත් පිළිවෙත් පුහුණුව හොඳින් ලැබීය. සංවර කම, හික්මීම, සුවච කීකරුබව, යන පැවිද්දට සුදුසුකම් සියල්ල නිමල් කුල කුමරු තුල දුටු ගුරු උතුමෝ මෙවන් පිනැති සිසුන්ගෙන් සසුනට සිදුවෙන මහ මෙහෙවර ද දුටු සේක.

ඒ අනුව වයසින් අවු. 21 ක් වූ නිමල් ගාමිණී බණ්ඩාර කුල කුමරු වර්ෂ 1982 බිනර මස සිවුවන දින දී ශ්‍රී කාල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක මහාබෝධිසත්ව ගුණෝපේත රාජකීය පණ්ඩිත අතිගෞරවණීය කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් අති උතුම් වූ පැවිදි සම්පත ලැබුයේ පූජ්‍ය දාස්වත්තේ සුමන සීල ස්වාමින් වහන්සේ නමින්ය.

## අධිසීල සංඛ්‍යාත උපසම්පදාව

අතිපූජණීය මිනුවන්ගවුවේ නාගිත මාහිමි අතිපූජණීය කොහෙල්පන්නල සුමන මා හිමි යටතේ විනය බණ දහම් හැදෑරූ පූජ්‍ය දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේ වර්ෂ 1984 පොසොන් මස 18 වන දින කොස්ගොඩ, දුවේමෝදර උදකුක්ඛේප සීමා මාලකයේ දී අතිගරු පූජණීය බෝධිසත්ත ගුණෝපේත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මා හිමි පාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් අධිසීල සංඛ්‍යාත උපසම්පදාව ලත් සේක.

## ඇදුරු පෙළ පත

පූජ්‍ය දාස්වත්සේ සුමනසීල ස්වාමින් වහන්සේ මැල්ලගල යෝගාශ්‍රමයේ දී විනය බණ දහම් ප්‍රගුණ කල අතර වැඩිදුර අධ්‍යාපපනය සඳහා වර්ෂ 1986 දී පමණ අම්බලන්ගොඩ කහව ගල්දුව ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා මූලස්ථානයට වැඩම කළ සේක. එහි දී රාජකීය පණ්ඩිත අතිගෞරවණීය කඩවැද්දුව මාහිමි

- **අතිගෞරවණීය නා උයනේ ශ්‍රී අරියධම්ම මා හිමි**
- **අතිගෞරවණීය රහතුන්ගොඩ බෝධිරතන මා හිමි**
- **අතිගෞරෙවණීය මීතලාවේ විනීත මා හිමි**
- **අතිගෞරවණීය වැවේගෙදර සෝමානන්ද මා හිමි**

යන යතිවරයන් වහන්සේලාගේ සෙවනේ තෙවලා දහම මැනවින් ප්‍රගුණ කළ අතර විනයාචාර්‍ය ගරු උපාධිය ද ලත් සේක.

## විශේෂ භාවනා පුහුණුව

ගල්දුව යෝගාශ්‍රම මූලස්ථානයේ දී වර්ෂ 1997 ජනවාරි 20 වෙනි දින පටන් පුරා මාසයක් තුළ බුරුමරට පා ඔක් චිත්තල සබ්බත අරණ්‍ය වාසී අතිපූජ්‍ය අග්ගඤ්ඤ ස්වාමින් වහන්සේගේ මූලිකත්වයෙන් පැවති මෙම භාවනා පුහුණුවේ දී තෝරාගත් යෝගාවචර

භික්ෂු පිරිසට අපි සුමන සීල ස්වාමීන් වහන්සේ ද ඇතුලත් විය. එම සඟ පිරිස වර්ෂ 1997 මාර්තු මස මිතිරිගල ධර්මායතනයට වැඩිදුර පුහුණුව පිණිස වැඩම කරවන ලදහ. එහි දී පා ඕක් භාවනා මාර්ගීය මැනවින් ප්‍රගුණ කළ අප මාහිමි පාණෝ ප්‍රධාන 10 නමක් සඟ පිරිස පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේ සමගින් බුරුමරට පා ඕක් චිත්තල පබ්බත අරණ්‍යසේනාසනය වෙත වර්ෂ 2010 දී වැඩම කරවා පුරා මාස 06 ක් විශේෂ භාවනා ගුරු පුහුණුවක් ලබා එහි දී කර්මස්ථානාචාර්ය තනතුර ලත් සේක. ඉන්පසු ලංකාවට වැඩම කළ උන් වහන්සේ වර්ෂ 2011 වස්සානයේ පන්සියගම නා උයන අරණ්‍ය සේනාසනයෙහි වස් වසා පූර්ණ විවේකයක් ගෙන භාවනානුයෝගීව ගත කළ සේක.

## පොල්ගසඕවිට බලා

පුරා වසර 15 ක් පමණ ගල්දූව යෝගාශ්‍රම මූලස්ථානයේ වැඩ සිටි උන්වහන්සේ ගිහි බොදුනුවන් උදෙසා භාවනා පුහුණුව ලබාදීම් වස් වර්ෂ 1998 ජනවාරි මස පොල්ගසඕවිට දික්හේන භාවනාමධ්‍යස්ථානයට වැඩම වන ලදි. එහිදී අති පූජනීය මීතලාවේ විනීත මා හිමිපාණන් වහන්සේගේ අනුසාසනා පරිදි නේවාසික සඟ පිරිසට ද ගිහි පිංවතුන්ට ද භාවනා කමටහන් දෙවා වදාරමින් පුරා වසර 15 ක් නේවාසිකව වැඩ සිටිසේක.

## අමිල සසුන් මෙහෙවර

ස්වකීය අර්ථසාධනයෙහිලා මුල්තැන දී කටයුතු කළ පූජ්‍යපාද දාස්වත්තේ සුමන සීල ථෙරපාණෝ ලක්දිව විවිධ සෙනසුන් - වෙහෙර විහාරස්ථානවල භික්ෂූන්ට මෙන්ම ගිහි භාවනාභිලාෂි භවතුන්ට ද භාවනා උපදෙස් ලබාදෙමින් සමථ - විදර්ශනාපාදක විශේෂ ධර්ම දේශනා, ධර්ම සාකච්ඡා, පවත්වා වදාලේ සැබෑ කර්මස්ථානාචාර්ය වරයෙක් වශයෙනි. ලක්දිව පුරා විවිධ ස්ථානවල භාවනා පුහුණු වැඩ සටහන් අතර ගල්දූව යෝගාශ්‍රම මූලස්ථානය, පොල්ගසඕවිට භාවනා මධ්‍යස්ථානය, නාථගණේ ආරණ්‍යසේනාසනය, කොළඹ යමුනා ආශ්‍රමය, කඩවත රම්මුතුගල මහා විහාරය, නාවලපිටිය බෝඋයන ආරණ්‍යය - අඹේපුස්ස නාවිමන ආරණ්‍යය, කොළඹ පුස්තකාල පරිශ්‍රයේ රාජ්‍යසේවා බෞද්ධ සංගමයේ භාවනා වැඩ සටහන, කොළඹ කල්‍යාණ ධර්මාශ්‍රමයේ භාවනා වැඩ සටහන ප්‍රධාන වශයෙන් සැලකිය හැක. ඊට අමතරව එක් දින භාවනා - පැය 2 - 3 වැඩ සටහන් ද විවිධ පළාත් වල විවිධ ස්ථානවල විශේෂ ධර්ම දේශනා පැවැත්වූහ. ජාතික ගුවන් විදුලිය, බෞද්ධයා ගුවන් විදුලිය, රූපවාහිනිය යන ශ්‍රව්‍ය - දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ ද ධර්ම දේශණා - ධර්ම සාකච්ඡා පැවැත් වූ සේක. ඊට අමතරව ධර්ම ග්‍රන්ථ රාශියක් ලියා නොමිලයේ බෙදා හරිමින් මුද්‍රිතමාධ්‍යයෙන් ද සුවිසල් සදහම් මෙහෙවරක් ඉටුරකරන ලදි.

# රොන් සොයා ආ බඹර කැල

අගනුවර මෙන්ම රටපුරා විසිර සිටින සැදැහැවත් බෞද්ධයෝ ද භාවනාභිලාෂී භික්ෂු සංඝයා ද යන ගිහි පැවිදි ශිෂ්‍යයෝ කර්මස්ථානාචාර්ය අතිපූජ්‍ය දාස්වත්තේ සුමන සීල ථෙරපාණන් වටා සදහම් රසය සොයා සිය දහස් ලක්‍ෂ ගණනින් එක් රොක් වූයේ රොන් සොයා යන බඹර කැලක් මෙනි. ඒ සැවොම මාහිමි තුමන්ගේ සත් පුරුෂ ඇසුර නිසාවෙන් දන්දෙන හැටි - සිල් රැකිය යුතු අයුරු, භාවනා වඩන අයුරු මැනවනින් දැන උගත්හ. ඒ උපදෙස් අනුව ආධ්‍යාත්මික ගුණ පෝෂණයෙහි නියැලුනහ. ධම -යෙන් සැනසෙන්නෙ වී අපමණයහ.

**අප්ජච්ඡා නිපාකා ඒතේ - අප්පාහාර අලෝලුපා**

**ලාභාලාභේන සන්තුට්ඨා - පරිවාරෙන්ති මං සදා**

( අල්පේච්ච වූ අල්පාහාර වූ ලොල්බව නොමැති මුහුකුරා ගිය නුවණැති ඔහු ලාභ අලාභ දෙකින්ම එකසේ සතුටු වුවාහු හැම කල්හි මා පිරිවරත්,

**ඣායි ඣානරතා ධීරා - සන්ත චිත්තා සමාහිතා**

**ආකිඤ්චඤ්ඤං පත්‍ථයන්තා - පාරිවාරෙන්ති මං සදා**

(ධ්‍යාන වඩන්නා වූ ධ්‍යානයෙහි ඇලුනා වූ ධෛර්‍ය සම්පන්න වූ ශාන්ත වූ එකග වූ සිත් ඇති පලිබෝධ විරහිත බව කැමති වන්නා වූ ඒ තවුසෝ හැමකල්හි මා පිරිවරත්)

**පල්ලංකේන නිසජ්ජාය - ඨාන චංකමනෙනච**

**වීතිනාමෙන්ති තේ රත්තිං - මම සිස්සා දුරාසදා**

(දුරාසද වූ ඒ මාගේ ශිෂ්‍යයෝ පලග බැඳීමෙන් ද , හිඳීමෙන් ද, සිටීමෙන් හා සක්මන් කිරීමෙන් ද රාත්‍රිය ගෙවත්,

**රජනීයෙන රජ්ජන්ති - දුස්සනීයේ න දුස්සරේ**

**මෝහනීයේ න මුය්හන්ති - මම සිස්සා දුරා සදා**

(ලංවිය නොහැක්කා වූ මාගේ ඒ ශිෂ්‍යයෝ ඇලිය යුතු දෙයෙහි නො ඇලෙත්. ගැටිය යුතු දෙයෙහි නො ගැටෙත්. මුලා විය යුතු දෙයෙහි මුලා නොවෙත් (සාරිපුත්ත ථේරපදාන)

# ශ්‍රද්ධා බලය

ලෝභාදී කෙලෙසුන්ට නොසෙල්විය හැකි තරමට, කෙලෙස් පීඩනය ඉවසිය හැකි තරමට කෙලෙසුන් පැරදිය හැකි තරමට නැසිය හැකි තරමට ශක්තිමත් වූ ශ්‍රද්ධාව ශ්‍රද්ධා බලයයි. සැම දෙනාටම ඇති වන සාමාන්‍ය ශ්‍රද්ධාව කෙලෙස් පීඩනයට ඔරොත්තු දෙන්නක්

නෙවේ. ධර්ම ශ්‍රවණාදියෙන් ශ්‍රද්ධාව ඇති වූ බොහෝ දෙනා දන් දෙන්නට සිල් රකින්නට සිතති. එහෙත් තෘෂ්ණාව ඉපිද මොහොතකින්ම ඒ අදහස් බැහැර වෙයි. ඔවුන් තෘෂ්ණාවට යට වී ඒ අදහස් කළ කිසිවක් නොකරති. භවභෝග සම්පත් හා කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන් පින්කම් කරන්නන්ගේ ශ්‍රද්ධාව භවභෝග සම්පත්වලට ආශාව වූ තෘෂ්ණාවට අනුකූල වූ තෘෂ්ණාවට යටත්ව පවතින ශ්‍රද්ධාවකි. එය තෘෂ්ණාව නැසීමට සමත් ශ්‍රද්ධාවක් නොවේ.

අප කලන මිතුරු සුමනසීල මහථෙරපාණෝ තෘෂ්ණාව මැඩලීමට සමත් වූ ආර්‍යවංශ ධර්මය විෂය කොට ඇති බෝධි පාක්ෂික වූ ශ්‍රද්ධා බලයම දියුණු කළ සේක. මාහිමි අනුසාසනා පරිදි සිදුකළ විසිතුරු සම්බුද්ධ පූජා දී විවිධ පිංකම් තුල දී ඒ බව මනාව ස්ඵුට විය. ඒ හුදෙක් ම ඕසතරණ ය සිදුකළ යුත්තේ ශ්‍රද්ධාවෙන්ම බව බුද්ධානුසාසනාව හෙයින් "සද්ධාය තරතී ඕඝං"

## මිත්‍රශීලිත්වය

**කෝසජ්ජං භයතෝ දිස්වා - අවිවාදං ච ඛේමතෝ**

**සමග්ගා සඛිලා හෝථ - ඒ සා බුද්ධාන සාසනී (චරියා පිටක)**

(අසමගි බව වාද විවාද කිරීම සියලු භයට හේතුවක් බවද අවිවාදය හෙවත් සමගිය ක්ෂේම භවයට හේතුවක් බව ද දැන මෘදු මොළොක් ප්‍රිය මනාප මෛත්‍රී කරුණා පූර්ණ වචන ඇති ව සමගි සම්පන්න වෙත්වා. මෙය ද බුද්ධානුසාසනාවකි.)

සතුරු මිතුරු සැමදෙනා කෙරෙහි මැදහත් සිතින් මෙත් වැඩූ අප මාහිමිපාණෝ ගිහිපැවදි සැම දෙනාගේ ගෞරවාදරයට පාත්‍ර වූ සේක. දුටු මාත්‍රයෙන් වෙත පැමිණෙන සැම මද සිනාවකින් යුතුව පිලිගැනීම මා හිමි චරිතයේ සුවිශේෂී ලක්‍ෂණයක් විය.

## විරිය පාරමී

**කොසජ්ජං භයතෝ දිස්වා - විරියාරම්භංච ඛේමතෝ**

**ආරද්ධ විරියාහෙථ - එසා බුද්ධාන සාසනී (චරියා පිටක)**

(අසලසකම සියලු භයට හේතුවක් බවද, අවදි කරවාගත් වීර්‍යය ක්ෂේම භාවයට හේතුවක් බව ද දැන ආරම්භ ධාතු - නෙක්ඛම ධාතු - පරක්කම ධාතු වීර්‍යය ඇත්තෝ වෙත්වා යන මෙය ද බුද්ධානුසනාවකි.

ආධ්‍යාත්මික ජිවිතය තුලද, වෙත පැමිණෙන සියලුම සාසනික කටයුතු වලද ඉහත සඳහන් ත්‍රිවිධ වියර්‍යය අප මා හිමි ජීවිත තුල දක්නට ලැබුණි. අසනීප - ගමන් වෙහෙස - උදේ දවාල රාත්‍රි කියා මේ කිසිවක් නොබලා පුරුෂ පරාක්‍රමයෙන් යුතුව සසුන් මෙහෙවරෙහි නියැලුණු සේක, පැමිණි බර ඉසිලීම - නොපැමිණි බර කරට නොගැනීම "ආගතං භරො වහති නො අනාගතං භාරං" යන සම්බුදු වදනට අනුකූලවමය .ඒ උන් වහන්සේග් විරිය පාරමිතාවයි.

## ශික්ෂාකාමිත්වය

සම්පන්න සීලා භික්ඛවේ විහරථ සම්පන්න පාතිමෝක්ඛා පාතිමොක්ඛ සංවර සංවුතා ආචාර ගෝචර සම්පන්නා අනුමත්තේසු වජ්ජේසු භයදස්සාවිනෝ සමාදය සික්ඛථ සික්ඛාපදේසු.

මහණෙනි, සීල සම්පන්නව වෙසෙව්, ප්‍රාතිමොක්ෂ සම්පන්නව වෙසෙව්. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් සංවර වෙව්. ආචාර ගෝචර සම්පන්න වෙව්. අනුමාත්‍ර වූ ද වරදෙහි භය දකින්නෝ වෙව්. මනාව සමාදන්ව ශික්ෂාපදයන්හි හික්මෙව්.

බොහෝ සූත්‍රවල දක්නා ලැබෙන මේ බුද්ධානුසාසනාව අති පූජ්‍ය කර්මස්ථානාචාර්‍ය දාස්වත්තේ සුමනසීල මාහිමපාණන් ඉතාමත් ගෞරවයෙන් සම්පූර්ණ කළසේක. සිකපද පිළිබඳ යම් සැකයක් හෝ ඇති වූ ව හොත් ආපත්ති දේශනා කිරීම වත්මානත් පුරා අබිහාන විනය කර්ම කොට ස්වකීය ශීල පරිශුද්ධිය ඇතිකරනු ලැබීය.

## නිහතමානී ගුණය

**නමන්ති ඵලිනො වෘක්‍ෂා - නාමන්ති විබුධා ජනා:**
**ශුෂ්කකාෂ්ටානි මූර්ඛාශ්ච - භිද්‍යන්තේ න නමන්ති ච**
(එල බර ගස් නැමෙති වියලි දර කැබැල්ල නොනැමේ. කැඩී යයි. ඥානවන්තයෝ සහ මෝඩයෝ මෙනි.)

ගස වැසෙන්න ගෙඩි ගටගත් පසු අතු සියල්ල බරවෙයි. නැමෙති. අතු නොකැඩෙති. එල බර ගසක ස්වභාවය එයයි. යහපත් මිනිසාගේ ස්වභාවයද එබඳුයි. ගුණයෙන් නුවණින් ධනයෙන් බලයෙන් කොතරම් බර වුවත් නැමෙන සුළුය. නම්‍යශීලි ලෙස ජීවත් වේ. උඩඟු නොවේ. ඇසුරු කිරීම පහසු වේ. වියලි දර කෝටුව නොනැමිය හැක. ලේසියෙන් නොනැමේ කැඩී යයි. වියලි මිනිසුන් එබඳුය. කිසිවෙකුටත් නොනැමෙති. නැවෙන ආකාරයට කථා කළහොත් - නමන්න උත්සාහ කළහොත් කැඩී යාමට සිදු වේ. ඒ වියළි මිනිසුන්ගේ සැටිය.

බුද්ධ ජීවිතය ශීලයෙන් ගුණ තේජසින් කොතරම් බර වුවත් හැම දෙනා කෙරෙහිම නම්‍යශීලි වූ සේක. ඇහුම්කම් දුන් සේක. ඒ නිහතමානි ගුණයයි. සුමනසීල ථෙරපාණෝ ද ගුරු උතුමන් ඉදිරියේ මෙන්ම සියලු දෙනා ඉදිරියෙහි නම්‍යශීලි වූ අතර නිහතමානිව පෙනී සිටි සේක. සියල්ලටම ඇහුම්කම් දුන් සේක.

## වැඩ විසු ස්ථාන

මැල්ලගල යෝගාශ්‍රමය, ගල්දුව යෝගාශ්‍රම මූලස්ථානය, පුහුල්වැල්ල, සිරි රෝහණ යෝගාශ්‍රමය, දික්හේන භාවනාමධ්‍යස්ථානය, පන්සියගම නා උයන අරණ්‍යය, මාස්පොත, මහකෙළිය නාථගණේ ආරණ්‍යය.

## අවසාන කාලය

ඉහත සඳහන් ස්ථානයන්හි වැඩ වාසය කරමින් ස්වකීය පැවිදි දිවිය ශීලයෙන්, සමාධියෙන් ප්‍රඥාවෙන් ද දානයෙන්, ප්‍රිය වචනයෙන් අර්ථ චරියාවෙන් සමානාත්මතාවයෙන් ද, යථාලාභ - යථාබල - යථා සාරුප්ප සන්තෝෂයෙන් ද, අපජිච්චතා සත්තුට්ඨිතා දී ගුණයන්ගෙන් ද පැවිදි ජීවිතය පරිපෝශිත කරගත් දාස්වත්තේ සුමනසීල ස්වාමිපාදයාණන් වහන්සේ වර්ෂ 2014 පෙබරවාරි මස පුරා වසර 15 ක් නේවාසිකව වැඩ සිටි පොල්ගස්ඕවිට, දක්හේන භාවනා මධ්‍යස්ථානයේ සිට කුරුණෑගල මාස්පොත නාථගණේ අරණ්‍ය සේනාසනය වෙත ස්ථිරවාසය පිණිස වැඩමවා පුරා වසරක කාලයක් අතිගරු පූජනීය හැවැත්පැලැස්සේ සිරි චන්දවංශාභිධාන මහාස්වාමිපාදයාණන් වහන්සේ ප්‍රමුඛ නේවාසික සඟ පිරිස සමග සාසනික සහෝදරත්වයෙන් සසුන් ගුණ වඩමින් වැඩ විසුයේ කල්‍යාණමිත්‍ර සම්පත්තිය මත පිහිටාගෙනය.

## අවසන් වැඩ සටහන

පුරා වසර 15 ක් තිස්සේ පවත්වාගෙන ආ ද්විමාසික දස දින භාවනා 2015 පෙබරවාරි 12 වන දින නාථගණ ආරණ්‍යයේ දී ඇරඹිණ, අළුයම 4 ට අරඹා රාත්‍රි 10 වන තෙක් නියමිත කාල සටහන ක්‍රියාත්මක වේ. අතිගරු දාස්වත්තේ සුමන සීල අප මාහිමි පාණෝ දිනපතා කමටහන් දීම - ධර්මදේශනා පැවැත්වීම මෙවරත් ඉටුකරනු ලැබුයේ තිස්සරණාද්ධ්‍යාශයෙන්මය. දින 7ක" පේළියට වැඩ සටහන පනගැන්වුනි. 2015 - 02 - 19 දින අළුයම 4 ට මින්නේරිය මහසෙන් අරණ්‍ය සෙනසුනේ ගුණානුස්මරණ පිංකමට අරාධනා ලැබී තිබුණි. එහෙයින් අප මාහිමි පාණෝ

2015 - 02 - 18 දිනයේ දී ද 100 කට අධික යෝගි පිරිසට කමටහන් දෙවා වදාරමින් දිනට නියමිත කාල සටහනේ අවසාන හෝරාවට පැමියේය. දැන් ධර්මදේශනාවට කාලයයි. උන් වහන්සේ දෙසුම ඇරඹූ සේක. යෝනිසෝ මනසිකාරයෙන් ධර්මයතුළ ජීවත් වන අයුරු ද කරන සියල්ල ඥාණසම්ප්‍රයුක්තව සිදු කරන ආකාරය ද සත්පුරුෂ ආශ්‍රය සද්ධර්ම ශ්‍රවණය - යෝනියෝ මනසිකාරය - ධර්මානුධර්ම ප්‍රතිපත්තිය තුලින් නිවන් මගට බැස ධර්මය අනුන්ට නොගලපා තමන්ට ගලපා ජීවිතය පවත්වා ගෙන යා යුතු බවට විචිත්‍රවත් ලෙස කරුණු ගලපා අවසන්හි සියලු සංස්කාර ධර්මයන්හි අනිත්‍ය - දුක්ඛ අනාත්ම වශයෙන් ත්‍රිලක්ෂණය විදර්ශනාවට හරවා දෙවියන් සහිත සදේවක ලෝකයාට පිං පමුණුවා තෙරුවන් වැද තෙරුවන් ක්ෂමා කරවාගෙන එදින රාත්‍රි 10.30 ට පමණ වැඩ සටහන නිමා විය. කුටියට වැඩම කළ මාහිමිපාණෝ මුහුණකට දොවා අසුන් ගවත වී ප්‍රත්‍යවේක්ෂා කොට පසුදා අළුයම මින්නේරිය බලා යන්නට ඇති බැවින් සැතපුනි.

## දෛවයේ සරදම

2013 - 02 - 19 දින අරුණෝදයත් සමග ස්වාමින් වහන්සේ සිරුරු කිස නිමවා ප්‍රත්‍යවේෂා කොට තෙරුවන් පුදා ගමනට සුදානම් විය. අතිගරු පූජනීය හැවැන්පැලැස්සේ චන්ද්‍රවංස මාහිමි. පූජ්‍ය දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේ පූජ්‍ය හිඳෝගම සිරිවිමල ස්වාමීන්වහන්සේ සහ මොරගොල්ලේ සුමිත්ත හිමි, වැල්ලිගිරියේ ඥාණරතන හිමි, පුස්සලව්න්නේ පියසිරි හිමි උඩගම පඤ්ඤවංස හිමි යන 7 නම ගමනට නියමිතව තිබුණි. වේලාව අළුයම 4.20 යි. වෑන් රිය පණ ගැන්විණි. ක්‍රමයෙන් මින්නේරිය බලා රිය ගමන් කරයි. ඒ අඳුරු පැය උදාවිය. හබරණ කැලය පසු වී දැන් මින්නේරිය සීමාවට පැමිණ ඇත. මහසෙන් අරණේ හීල් දානය පිළියෙල වී ඇත. සැදැහැතියන් මහ සඟ රුවන පිළිගැනුමට පොරකමින් පේළි වෙති. මද වේලාවකින් මහසේන අරණේ විමලඥාණ හිමියන්ට දුරකථන පණිවිඩයක් ලැබෙයි. මින්නේරියේ දී රිය අනතුරක් වුණා. ස්වාමින් වහන්සේලා රෝහල් ගත කෙරුනා. සුමන සීල ස්වාමින් වහන්සේට ටිකක් බරපතලයි. දානයට එන්න බැරිවෙයි. කියා හිසට බරපතල තුවාල සිදු වූ අප මාහිපාණෝ පොළොන්නරුව ශාරෝහලෙන් නුවර මහ රෝහලට මාරු කෙරිණි. දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර කෙරෙයි. මේ අසුභ ආරංචියෙන් කම්පා වූ යෝගශ්‍රමීය සඟ පිරිස හා දායක දායිකාවෝ බෝධි පූජා - සෙත් පැතීම් - අභය දාන දී පිංකම් සිදු කලේ මා හිමි ජීවිත කෙසේ හෝ රැකේවා යන මෙත් සිතිණි. වෛද්‍ය ප්‍රතිකාර අඩුවක් නොවීය. හිසට දැඩිසේ හානි සිදු වී තිබූ හෙයින් සියලු උත්සාහයන් නිශ්චල විය. සසුනඹරේ සුපුන් සඳක්ව බොදු ලොව එළිය කරමින් වැඩ සිටි මාහිමි සඳ අවු. 59 ක් ආයු වලදා මරණයෙහි අඳුරු වළාගැබින් වැසී ගියේ 2015 - 02 - 22 දින රාත්‍රී 10.30 ට පමණය. වයධම්මා සංඛාරා - ජීවිතං අනියතං මරණං නියතං.

## උපකාරානුස්සති

මේ නොයෙක් සසුන් මෙහෙවර කළේ නානාවිධ රෝග පීඩාද ඇතිවය. ගත වූ ජීවිතය තුළ දේශීය ආයුර්වේද වෛද්‍යවරු රැසක් උන්වහන්සේගේ සුවපත් බවට දායක වූහ. එමෙන්ම බටහිර වෛද්‍යවරු රැසක් මේ උදාර ජීවිතය නිරෝගීව පවත්වා ගැනීමට දායක වූහ. අනතුරු වූ තැන්පටන් පොළොන්නරුව - මහනුවර රෝහල් ඇතුලු වෛද්‍යවරුද කාර්යමණ්ඩලද මහත් සේ උපකාර කළහ. හැම කල්හි අරිය මග්ග සංවිධානය සමීපව උන්වහන්සේ රැක බලා ගත්තේය. ගල්දුව යෝගාශ්‍රම මූලස්ථානය ඇතුලු සෙනසුන් ද නේවාසිකව සිටි සෙසනුවල පැවිදි ගිහි දෙපසද බොහෝ භාවනා සංවිධානද උන්වහන්සේ ශාසන වස්තුවක් මෙන් රැක ගත්හ. අද ඒ සැවොම වේදනා හරිතව අදාහන පූජාව කරති. මෙසේ සිහිපත් කළ නො කළ සියලු පැවිදි ගිහි සත් පුරුෂයෝ කෘතවේදිත්වයෙන් සිහිපත් කරමු. සෙත් මෙත් පවත්වමු. තෙරුවන් සරණ පතමු.

## ආදාහණපූජෝත්සවය

අපවත් වී වදාල අති ගෞරවණීය කර්මස්ථානාචාර්ය දාස්වත්තේ සුමන සීල ස්වාමින් වහන්සේගේ ශ්‍රී දේහය 2015 පෙබරවාරි 24 - 25 දෙදින තුල පොල්ගස්ඕවිට දික්හේන භාවනා මධ්‍යස්ථානයෙහි අගනුවර ජනතාවගේ අවසන් ගෞරවය උදෙසා තැන්පත් කොට තැබිණි. 2015 - 02 - 25 දින රාත්‍රි 7 ට පමණ කුරුණෑගල මාස්පොත නාථගනේ අරණ්‍යස්ථ ධර්මශාලා පරිශ්‍රයේ දින තුනක් ශ්‍රී දේහය මහ ජනතාවගේ අවසන් ගෞරවය පිණිස තැන්පත් කෙරිණි. සිය ගණන් භික්ෂු සංඝයා ද දහස් ගණන් බෞද්ධ ජනතාවද වැල නොකැඩී පැමිණෙමින් අප මාහිමි ශ්‍රී දේහයට ගරු බුහුමන් දක්වන අයුරු පෙනි ගියහ.

අතිගරු පූජනීය නාථගනේ ආරණ්‍ය සෙනසුන්පති හැවැත්පැලැස්සේ චන්ද්‍රවංශාධාන අප ගුරුදේවෝත්ම මාහිමි පාණන් වහ්නසේගේ අනුසාසනා පරිදි 2015 - පෙබරවාරි 28 වෙනි ශනි දින ප.ව 2.00 ට 150 නමකට අධික මහ සඟරුවනකගේ ද, නාථගණ අරණ්‍ය සේනාරක්‍ෂක මණ්ඩලය ප්‍රධාන දහස් සංඛ්‍යාත බෞද්ධ ජනතාවගේද උත්මාචාර මධ්‍යයෙහි නාථගනේ අරණ්‍යස්ථ ආදාහන මළුවේදී ආදාහන පූජෝත්සවය අරණ්‍ය සම්ප්‍රදායානුකූලව සිදු කරනු ලැබේ.

## ත්‍රිලක්‍ෂණය

හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් අවිඤ්ඤාණක සවිඤ්ඤාක සියලු සංස්කාර ධර්මයෝ ක්‍ෂනයක් ක්‍ෂණයක් පාසා ඇතිව නැතිව යන බැවින් අනිත්‍යයෝය. ඇතිවීම නැතිවීම නිරතුරු පෙලෙන බැවින් දුක්ඛයෝය. තම තමා කැමති ලෙස නොපවතින බැවින් අනාත්මයෝය. අනිත්‍ය

- දුක්ඛ - අනාත්ම වූ සියලු නාමරූපයෝ ඒකන්තවයෙන් දුක්ඛ සත්‍ය නම් වන්නේය. ඒ දුක්ඛ සත්‍යය උපදවන්නා වූ පූර්වභව තෘෂ්ණාව ඒකාන්තයෙන් සමුදය සත්‍ය නම් වන්නේය. ඒ දෙකහි නොපැවැත්ම නම් වූ ශාන්ත නිර්වාණය ඒකාන්තයෙන් නිරෝධ සත්‍යය නම් වන්නේය. ඒ නිරෝධ සත්‍යය අවබෝධ කර ගැනීම පිණිස වැඩිය යුතු වූ ආර්‍ය්‍ය අෂ්ඨාංගික මාර්ගය ඒ කාන්තයෙන් මාර්ග සත්‍ය නම් වන්නේය. අපවත් වී වදාල පරම කල්‍යාණ මිත්‍ර අති පූජ්‍ය කර්මස්ථානාචාර්‍ය්‍ය දාස්වත්තේ සුමන සීල ස්වාමීන් වහන්සේ මෙම චතුරාර්‍ය්‍ය සත්‍ය සුවසේ අවබෝධ වීමෙන් අමාමහ නිවනින් සැනසීම ලබත්වා.

## ප්‍රාර්ථනාව

**ඉමිනා අධිකාරේන කතෙන සුද්ධ චේතසා**
**සුමන සීලො මහාථේරො පාපුණාතු සිවං පදං**

**"කියයි අනියත බව නිරතුරු**
**හැගෙයි ලෝ සැබෑ තතු**
**අකලට මිලානව ගිය දිවි කුසුම**
**නික්ම ගියද සමුගෙන මහිම සඳ**
**රැදෙනු ඇත සදා ඔබ ගුණ කඳ**
**පිබිදුනු නෙක සිත් තුල .......**
**නිමාවට පෙර මෙසසර**
**ඇරයුම බැතියෙන් යලිත්**
**පුදින්නට මිනිස් විල මැද පියුමක්ව**

*අපවත් වී වදාල අතිපූජනීය කම්ටධානාචාර්‍ය්‍ය දාස්වත්තේ සුමනසීල ස්වාමීන් වහන්සේට නිවන් සුව අත්වේවා.*

2015 පෙබරවාරි 28 දින